# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,720 — 1966 නොවැම්බර් 3 වැනි බ්‍රහස්පතින්ද — 1966.11.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| ළොත් පාලන නිවේදන | 789 | ආදයම හා වියදම් පිළිබඳ ප්‍රකාශන | — |
| කතුරු–ඇණිරීකු | 790 | අය–වැය ලේඛන | 794 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — | දේපළ විකිණීම | — |
| අතුරු ව්‍යවස්ථා | 793 | මාර්ග කොමිටි දන්වීම | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දන්වීම | 794 | විවිධ දන්වීම | 798 |



## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥපනත

#### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥපනතෙහි 13(1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර (ඉහළ) මධ්‍යම දිසාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්, ඩී. අලුවිහාරේ වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුව ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ සභික විජේපාල පුරිජ්ජල මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට (3) වැඩි ගණනකට, තමන් තෝරා පත්කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුව ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ සභික විජේපාල පුරිජ්ජල මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩී. අලුවිහාරේ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(ඉහළ) මධ්‍යම දිසාව.

1966 ඔක්තෝබර මස 15 වැනි දින,
මාතලේ දීය.

11–221—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥපනත

#### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ (සංශෝධන) ගම්සභා පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, උතුරු මධ්‍යම කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කෝලිත වල්ගමගේ වන මම, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩපත්තුව ගම්සභාවේ අංක 4 දරණ කොට්ඨාශයෙහි සභික අහමදු ලෙබ්බේ මුනාලිබ් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු, නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩපත්තුව ගම්සභාවේ අංක 4 දරණ කොට්ඨාශයෙහි සභික අහමදු ලෙබ්බේ මුනාලිබ් මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

කෝලිත වල්ගමගේ,
උතුරු මැද කොට්ඨාශයේ පළාත් පාලන
සහකාර කොමසාරිස්.

1966 ඔක්තෝබර් මස 24 වෙනි දින,
අනුරාධපුරයේ දීය.

11–215—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි මස 15 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ථටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරු වනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරින් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට සූදානම්ව සිටිත්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහ යක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි සම්පූර්ණ අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**සැ. යු.**—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ———තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ———.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.

ජාතිය :———.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදැහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :———.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :———.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :———.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දන්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්— සේනාංකය තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාතේ පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

**2 වන ශ්‍රේණියේ පළාත් පාලන පරිපාලන සේවයට බඳවා ගැනීම (නාගරික කොමසාරිස්වරු (කොළඹ සහ මහනුවර හැර), ලේකම්, කොළඹ නගර සභාව)**

ඉහත සඳහන් සේවය සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප : තනතුරට නියමිත වැටුප් ක්‍රමය : රු. 6,960—360×4—480×10—රු. 13,200 වාර්ෂිකව. මෙහි රු. 11,280 වාර්ෂික වැටුප මත ඇවුරුදු නැවැත්මක් හා රු. 11,760 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ද වෙයි.

3. පහත සඳහන් අයගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ:—

(අ) ආණ්ඩුවේ හෝ බාහිර සේවයක මාණ්ඩලික තත්ත්වයේ පරිපාලන තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු 6 ක පළපුරුද්දක් ඇති, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයන්, හෝ

(ආ) ස්වකීය වෘත්තියෙහි යටත් පිරිසෙයින් අවුරුදු 6 ක සේවයක් ඇති වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයන්, හෝ

(ඇ) රුපියල් 5,340 වාර්ෂික වැටුපක් ලබන පළාත් පාලන පරිපාලන සේවයේ 3 වැනි පන්තියට අයත් නිලධාරීන් හා මාණ්ඩලික තත්ත්වයේ තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු 6 ක පළපුරුද්දක් ඇති පළාත් පාලන සේවයේ මාණ්ඩලික තනතුරු දරන නිලධාරීන්,

ඉහත 3(අ) හෝ 3(ආ) ඡේදයන් යටතේ අයදුම් කරුවෙකු තෝරා ගනු ලැබුවහොත්, පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පෙත්තක තබනු ලැබේ.

අයදුම්කරුවෝ ලාංකිකයන් විය යුතුය. ඔවුන් 1966. 11. 22 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට අතිකුත් සුදුසුකම් තිබේ නම් වයස පිළිබඳ නියමය නොතකා ඉල්ලුම් කර සිටිය හැක.

4. තෝරාගනු ලබන අයදුම්කරුට, පළාත් පාලනය, පළාත් පාලන සේවය ව්‍යවස්ථා හා ඊට සම්බන්ධ නීති රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා, ආඥා පනත්, ඒ යටතේ සම්පාදිත රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා, මුදල් හා ගණන් තැබීමේ නීති රීති, රෙගුලාසි චක්‍රලේඛ ආදී ප්‍රාදේශීය බලමණ්ඩලයන්ට අදාළ දේ ගැන පෘථුල දැනීමක් ලබා ගන්නා ලෙස නියම කෙරේ. ඔහුගේ දෙවැනි වැටුප් වැඩිවීම ගෙවීමට පළමු මේ විෂයයන් සම්බන්ධ පරීක්ෂණයකින් සමත් වන ලෙසද නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. අයදුම්පත් තැපැලේදී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු අයදුම් පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966. 11. 22 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අතිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිල ධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්ත මේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බව සහතික කර, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර් දේශ කළහොත් පමණි.

10. සුදුසුකම්ලත් සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 23 දින,
තැ. පෙ. 530, කොළඹ.

11-207—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී 19/47.

### වැලිමඩ සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ වැලිමඩ සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.10.20 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. (1) පහත දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. කොහු නිපදවීම හෝ ගබඩා කිරීම.
2. කොප්පරා නිපදවීම හෝ ගබඩා කිරීම.
3. මෝලෙන් හෝ සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම.
4. කපාපු පොල් සකස් කිරීම.
5. කපු පුළුන්, පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම.
6. පොල්තෙල් ගැළුම් 50 ට වඩා ගබඩා කිරීම.
7. ජල බලයෙන් හෝ වාෂ්ප බලයෙන් හෝ යන්ත්‍රානුසාරයෙන් ලී සහ දැව දඬු ඉරීම.
8. හිස් ගෝනි ගබඩා කිරීම.
9. භූමිතෙල් ගබඩා කිරීම.
10. විදුලිය වැඩ පොළක් පවත්වාගෙන යෑම.
11. මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.
12. ස්වර්ණාභරණ සාදන ස්ථානයක් පවත්වාගෙන යෑම.

(2) පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. පොහොර සෑදීම.
2. සබන් සෑදීම.
3. උම්බලකඩ හොන්. 3 කට වඩා ගබඩා කිරීම.
4. ලුණු මාළු හොන්. 3 කට වඩා ගබඩා කිරීම.
5. කරවල හොන්. 3 කට වඩා ගබඩා කිරීම.
6. හුණු ගෝනි 1 කට හෝ ගැළුම් 4 පිත් 1 එකකට වඩා ගබඩා කිරීම.
7. කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි 3 කට වඩා ගබඩා කිරීම.
8. යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ වෙනත් කුළු බඩු ඇඹරීම.
9. යන්ත්‍රානුසාරයෙන් වී, තිරිඟු, කුරක්කන් හෝ වෙනත් ධාන්‍ය වර්ග ඇඹරීම.
10. බීඩි සෑදීම. (එතීම)
11. සුරුට්ටු සෑදීම. (එතීම)
12. පැස්සීමේ වැඩ සඳහා හෝ ලියවන පට්ටලයක් පාවිච්චි කරනු ලබන වැඩ සඳහා වැඩ පොළක් පවත්වාගෙන යෑම.
13. ටයර් සහ ටියුබ් වෝල්කනයිසින් වැඩ කරන ස්ථානයක් පවත් වාගෙන යෑම.

(3) පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක සහ අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. ගඩොල් හෝ උළු පිච්චීම.
2. හුණු පිච්චීම හෝ සකස් කිරීම.
3. දර හෝ ලී ගබඩා කිරීම.
4. ගඩොල්, කබොක්, උළු හෝ කළුගල් ගබඩා කිරීම.

2. වැලිමඩ සුළුනගර සභාව විසින් සම්පාදිතව, 1947 ජූලි 18 වැනි දින අංක 9,737 සහ 1955 අගෝස්තු 5 වෙනි දින අංක 10,824 දරණ ගැසට් පත්‍රවල පළ කරන ලද අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

11-247—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී 73/47.

### පොල්ගහවෙල සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 යන වගන්ති යටතේ පොල්ගහවෙල සුළු නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.10.20 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1949 අප්‍රේල් 22 වන දින අංක 9,969 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ද, 1952 මැයි 23 වන දින අංක 10,395 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබූ ද අතුරු ව්‍යවස්ථාවල 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ "අප්‍රසන්න හෝ අන්තරායදායක ව්‍යාපාර" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "වී කෙටීම සඳහා හාල් මෝලක් පවත්වාගෙන යාම" යන වචන වෙනුවට "වී කෙටීම සඳහා හාල් මෝලක් පවත් වාගෙන යාම, යකඩ බඩු ගබඩා කිරීම, වඩු මඩුවක් පවත්වාගෙන යාම, විදුලිය වැඩ පළක් පවත්වාගෙන යාම, සිමෙන්ති ගබඩා කිරීම, ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම, බේලෙක් වැඩ පළක් පවත්වාගෙන යාම, සහ කෘත්‍රිම පෝර ගබඩා කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

11-246—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උප්පුවෙලි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ, එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.9.26 වෙනි දින,
කොළඹදීය.

### ආයුර්වේද ඖෂධ ශාලාවට අදාළ වන අතුරු ව්‍යවස්ථා

1. 1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 36 (ඇ) වැනි වගන්තිය යටතේ, සභාව විසින් උප්පුවෙලියෙහි පිහිටුවන ලද ආයුර්වේද ඖෂධ ශාලාව, සභාව විසින් පවත්වාගෙන යා යුතු අතර 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි කරන ලද ආයුර්වේද වෛද්‍යවරයකු භාරයේ එය තැබිය යුතුය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආයුර්වේද වෛද්‍යවරයා විසින් හෝ සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආයුර්වේද

ඖෂධ ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් පොත් හා වෙනත් වාර්තා සභාව විසින් අනුමත කරනු ලබන ආකෘතිය අනුව හා එසේ අනුමත කරනු ලැබිය හැකි ආකාරයට තැබිය යුතු ය.

3. ආයුර්වේද ඖෂධ ශාලාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අර මුදල් සභාව විසින් පොදු අරමුදලින් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළ යුතු අතර, එසේ පරිහරණය කිරීම සඳහා සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ වරින් වර සභාව විසින් සම්මත කරනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් මුදල් වෙන් කළ යුතුය.

4. ආයුර්වේද ඖෂධ ශාලාවේ ලෙඩුන්ට ප්‍රතිකාර කිරීම නොමිලයේ විය යුතු ය.

5. ආයුර්වේද ඖෂධ ශාලාව පවත්වාගෙන යාම පිණිස හිතවතෙකු ගෙන් ලැබෙන යම් පරිත්‍යාග මුදලක් ඖෂධ ශාලාවේ වියදම් පියවා ගැනීම පිණිස යෙදවිය යුතු ය.

6. සභාපති විසින් දෙසැම්බර් මාසයේ 31 වැනිදා අවසන් වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද ඖෂධ ශාලාවේ අය වැය දැක්වෙන ප්‍රකාශයක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතුය.

7. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද ඖෂධ ශාලාව" යනුවෙන් සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන ආයුර්වේද ඖෂධ ශාලාව අදහස් වේ.

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උප්පුවෙලි ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

11-197—66.11.3 දින අංක 14,720 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### මහනුවර දිස්ත්‍රික්කය—මැදදුම්බර මැදසියපත්තු ගම් සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 26(2) (ඒ) සහ 35(1) වැනි වගන්ති අනුව නියම කරන ලද නාම යෝජනා දිනයන්හි මැදදුම්බර මැදසියපත්තු ගම් සභාවේ අංක 4 සහ 5 දරණ කොට්ඨාශ උදෙසා කිසිම අපේක්ෂකයකුගේ නාම යෝජනාවක් ඉදිරිපත් නොකරන ලද බව, එම ආඥාපනතේ 35(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. ආර්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල)

1966 ඔක්තෝබර මස 10 වැනි දින,
කොළඹ දීය.

11-231—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## අය-වැය ලේඛන

### පොළොන්නරුව සුළු නගර සභාව

**1966 අය වැය ලේඛනය**

**මුදල් නියෝග 40 (11) යටතේ—කෙරෙන අයදුම්පත**

1966 අයවැය ලේඛණයේ වෙන් කරණ ලද මුදල් පහත සඳහන් පරිදි ශීර්ෂවලට මාරු කිරීම 66.9.30 වැනි දින මාසික සභා රැස්වීමේදී අංක 8 (1) දරණ යෝජනාවෙන් සභා සම්මත විය:—

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. | ශ. | අවශ්‍ය මුදල් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී.—(1) (ජී) (1) සෞඛ්‍ය පරීක්ෂකවරු ... ... | 1,182 | 0 | ඒ.—(2) (අජ්) ලිපිද්‍රව්‍ය ... ... ... | 300 | 0 |
| ඩී.—(1) (ජේ) සෞඛ්‍ය සතිය ... ... | 200 | 0 | ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 300 | 0 |
| ඩී.—(4) (ඩී) ගෝ ඝාතන ස්ථාන ... ... | 1,500 | 0 | ඩී.—(3) (ඊ) වැසිකිළි ... ... ... | 275 | 0 |
| ඩී.—(3) (බී) ගොන්, කරත්ත, ලොරි ... ... | 1,038 | 0 | ඩී.—(5) (සී) ළිං ... ... ... | 395 | 0 |
| | | | ඩී.—(3) (ඒ) වැසි. කම්කරු වැටුප් ... ... | 1,500 | 0 |
| | | | සී.—(7) ගොඩනැගිලි ... ... ... | 1,150 | 0 |
| | 3,920 | 0 | | 3,920 | 0 |

**II කොටස—විදුලි අංශය**

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊ.ඇල්.—(2) (ඒ) ගොඩනැගිලි ... ... | 5,500 | 0 | ඊඇල්.—(6) වැඩිදියුණු කිරීම ... ... | 5,000 | 0 |
| | | | ඊඇල්.—(2) (ඩී) නඩත්තුව ... ... | 500 | 0 |
| | | | | 5,500 | 0 |

එච්. ජී. පී. නෙල්සන්,
සභාපති,
උප නගර සභාව, පොළොන්නරුව.

අනුමත කරමි.

කේ. වල්ගමගේ,
ප. පා. ස. කොමසාරිස්තුමා,
අනුරාධපුරය.

පළාත් පාලන කායර්‍යාලය,
අනුරාධපුරය,
1966 ඔක්තෝබර් මස 18 වැනි දින.

11-203—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## මහරගම නගර සභාව

### 1966 වර්ෂයේ තුන්වෙනි පරිපූරක අයවැය ලේඛණය

### I වෙනි කොටස—සාමාන්‍ය අංශය

| ශීර්ෂය හා උප ශීර්ෂය | විස්තරය | මුදල රු. ශ. | සම්මත වූ දිනය හා යෝජනා අංකය |
|---|---|---|---|
| බී 4 | වීථි ආලෝකය | 6,400 0 | 1966.10.15 ; යෝජනා අංක 3 (බී) |

1966 ඔක්තෝබර් මස 15 වෙනි දින සභා රැස්වීමේදී අංක 3 (බී) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම නගර සභාව.

1966 ඔක්තෝබර් මස 20 වෙනි දින,
නගර සභා කාර්යාලය,
මහරගම.

11-229—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රයයි

### 1966 අය-වැය ලේඛණය

#### 1 වෙනි කොටස

1966 වර්ෂයේ අය වැය ලේඛණයේ මුදල් ඉතුරුවේයැයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත පෙන්වන පරිදි මුදල් මාරුකිරීමට 1966 ක් වූ අගෝස්තු මස 29 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 3 (1) දරන යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ඉතිරි වේයයි ගණන් බලා ඇති උප ශීර්ෂ

| | | රු. ශ. |
|---|---|---|
| ඊ.—(1) (ඊ) | කාර්මික උපදේශක ගාස්තු | 100 0 |
| ඊ.—(2) (ඊ) | නීති උපදේශක ගාස්තු | 200 0 |
| ඊ.—(2) (ජේ) | හදිසි වියදම් | 100 0 |
| ඊ.—(2) (එම්) | අතිකාල දීමනා | 250 0 |
| බී.—(7) | ඉඩම් සතුකර ගැනීම | 100 0 |
| ඕ.—(4) | නඩත්තු කිරීම | 200 0 |
| ඩී.—(1) (එච්) | කානු ඉදිකිරීම | 1,000 0 |
| | එකතුව | 1,950 0 |

වැඩිපුර මුදල් අවශ්‍යව ඇති උප ශීර්ෂ

| | | රු. ශ. |
|---|---|---|
| ඩී.—(5) (සී) | නඩත්තුව | 400 0 |
| ඊ.—(2) | නඩත්තුව | 1,550 0 |
| | එකතුව | 1,950 0 |

#### 2 වෙනි කොටස

ඉතිරිවේයයි ගණන් බලා ඇති උප ශීර්ෂ

| | | රු. ශ. |
|---|---|---|
| 4 (ඒ) | පාලන වේතන හා දීමනා | 600 0 |
| 4 (බී) | බාහිර සේවක වේතන හා දීමනා | 600 0 |
| | එකතුව | 1,200 0 |

| | | රු. ශ. |
|---|---|---|
| 3 (ඒ) | සේවය හා නිවාස සම්බන්ධතාවෝ | 1, 00 0 |
| | එකතුව | 1,200 0 |

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1966.8.29 වෙනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්‍ය්‍යාලයේදීය.

අනුමත කරමි.
කේ. වල්ගමගේ,
උතුරු මධ්‍යම කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

පළාත් පාලන කාර්‍ය්‍යාලය,
අනුරාධපුර.
1966.9.4.

11-201—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## තිස්සමහාරාම නගරය

### 1966 වර්ෂයේ පළමුවන අතිරේක අය-වැය ලේඛනය

### 2 වන කොටස—විදුලි අංශය

| | රු. ශ. |
|---|---|
| ඒ—ඉන්ධන | 750 0 |
| බී—යන්ත්‍ර සූත්‍ර බොයිලේරු සහ උපකරණ | 5,000 0 |
| සී—මාපක යන්ත්‍ර, විදුලිය යකුරු සහ වෙනත් භාණ්ඩ | 1,500 0 |
| ඩී—විදුලි බලය සපයන සහ සම්ප්‍රයේශන මාර්ග නඩත්තුව | 9,000 0 |
| ඒ—උපකරණ | 500 0 |
| බී—බාහිර සේවක වේතන හා දීමනා (අන් අයුරින් වෙන් නොකළ) | 1,000 0 |
| ඩී—විවිධ වැඩ | 2,000 0 |
| | 19,750 0 |

සම්මත කරන ලදී.
ඇම්. ඇල්. ඇම්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

විශේෂ කොමසාරිස් කාර්‍ය්‍යාලය,
තිස්සමහාරාම , 1966.9.30.

අනුමත කරන ලදී.
එච්. ජේ. පී. අභයවර්ධන,
පහළ දකුණු දිසාවේ
පළාත් පාලන සහකාර කොමසාරිස්.

මාතර, 1966. 10. 26.

11-235/1—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## තිස්සමහරාම නගරය

### මුදල් රෙගුලාසි නීති අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රයයි

### අය-වැය ලේඛනය—1966

1966 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේ යයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට මවිසින් තීරණය කරන ලදී.

| | ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 (ඊ) | කාර්මික උපදේශ ගාස්තු ... ... | 100 | 0 |
| ඒ 1 (ජී) | ජීවනාධාර ... ... | 1,500 | 0 |
| ඒ 2 (ඒ) | දීමනා (අන් අන්දමකින් වෙන් නොකළ) ... | 150 | 0 |
| ඒ 2 (ඩී) | තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 250 | 0 |
| බී 2 | නඩත්තුකිරීම ... ... | 1,200 | 0 |
| බී.3 | යන්ත්‍ර සහ ආයුධ ... ... | 100 | 0 |
| බී 7 | ඉඩම් සතු කර ගැනීම ... ... | 5,000 | 0 |
| බී 8 | ප්‍රතිසංස්කරණය ... ... | 9,500 | 0 |
| සී 4 | නඩත්තුකිරීම ... ... | 2,000 | 0 |
| ඩී 1 (එච්) | කාණු ඉදිකිරීම ... ... | 8,120 | 0 |
| ඩී 1 (ජේ) | සෞඛ්‍ය සතිය සඳහා වියදම් ... ... | 100 | 0 |
| ඩී 1 (කේ) | කිරි විග්‍රහ කිරීම් සඳහා ගාස්තු ... | 100 | 0 |
| ඩී 1 (එන්) | මාතෘධාරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 480 | 0 |
| ඩී 7 (බී) | නඩත්තු ... ... ... | 2,000 | 0 |
| ඩී 7 (සී) | මුද්‍රණ ගාස්තු ආදිය ... ... | 400 | 0 |
| එෆ් 3 | ඉදිකිරීම් ... ... ... | 2,000 | 0 |
| ජී 1 | සුනඛ ඝාතනය ... ... | 700 | 0 |
| අයි 1 | ගිනි නාශක බඳුන් වියදම් හා නැවත පිරවීම් ආදියෙහි වියදම් ... ... | 250 | 0 |
| ජේ 1 | වේතන ... ... ... | 420 | 0 |
| ජේ 3 | පොත් පත් හා සඟරා ... ... | 3,000 | 0 |
| ජේ 4 | ද්‍රව භාණ්ඩ ... ... ... | 1,000 | 0 |
| ජේ 5 | නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| ජේ 6 | ජීවනාධාර ... ... ... | 576 | 0 |
| | | 40,946 | 0 |

| | වැඩිපුර වියදම් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 (බී) | ලිපිකරුවෝ ... ... | 200 | 0 |
| ඒ 2 (සී) | අයකැමි ගාස්තු (අන් අන්දමකින් අයනොකළ) | 400 | 0 |
| ඒ 2 (අයි) | නිවාඩු දුම්රිය බලපත් ගාස්තු ... | 500 | 0 |
| ඒ 2 (කේ) | කාර්‍යාල භාණ්ඩ සහ උපකරණ ... | 500 | 0 |
| බී 4 | වීදි ආලෝක කිරීම ... ... | 1,000 | 0 |
| සී 7 | නව කර්මාන්ත ... ... | 2,396 | 0 |
| ඩී 2 (ඒ) | දෛනික වැටුප් ... ... | 200 | 0 |
| ඩී 2 (බී) | ගොන් කරත්ත සහ ලොරි ... ... | 30,000 | 0 |
| ඩී 5 (බී) | උපකරණ ... ... | 3,500 | 0 |
| ඩී 5 (සී) | නඩත්තුකිරීම ... ... | 2, 000 | 0 |
| ඩී 6 (බී) | නඩත්තු ... ... | 250 | 0 |
| | | 40,946 | 0 |

1966 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින,
තිස්සමහාරාම විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දීය.

ඇම්. ඇල්. ඇම්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

අනුමත කරණ ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
පහළ දකුණු දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

මාතර, 1966.10.26.

11-235/2—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## පස්සර සුළු නගර සභාව

### 1966 තෙවන පරිපූරක වැය ලේඛනය

### පළමුවන කොටස—සාමාන්‍ය

### අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | රු. | ශ. | අනුමතිය |
|---|---|---|---|
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු සඳහා ... | 500 | 0 | 1966 අගෝස්තු 25 වෙනි දින රැස්වීමේ 3 වෙනි යෝජනාව |
| ඒ.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් සනාදියට | 300 | 0 | |
| ඒ.—(2) (කේ) කාර්‍යාලයීය භාණ්ඩ මිලයට ගැනීම සඳහා | 300 | 0 | |

| වැය ශීර්ෂය | රු. | ශ. | අනුමතිය |
|---|---|---|---|
| ඩී.—(5) (ඒ) ජලය සැපයීම වැටුප් ... | 400 | 0 | 1966 සැප්තැම්බර් 27 වෙනි දින රැස්වීමේ 7 වෙනි යෝජනාව |
| ඩී.—(5) (සී) ජලය සැපයීම නඩත්තුව | 1,000 | 0 | |

මෙම වැය ශීර්ෂයන් ඉහත සඳහන් යෝජනා යටතේ සභා සම්මත වූ බවට සහතික කරමි.

ඇ. පි. ඇඩ්මන්,
සභාපති,
සුළු නගර සභාව, පස්සර.

1966.10.19 වෙනි දින,
පස්සර සුළු නගර සභා කාර්‍යාලයේදීය.

11-214—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

### 1966 වර්ෂයේ තුන්වැනි පරිපූරක අයවැය ලේඛනය

### 1 වැනි කොටස

| වැය ශීර්ෂය | යෝජිත වැය රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඇජ්) විශ්‍රාම (විශ්‍රාම වැටුප්, සේ.අ. අරමුදලේ දායක මුදල්) ... ... | 280 | 0 |
| ඒ.—(2) (ඇජ්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ හා මුද්දර යනාදිය ... | 600 | 0 |
| සී.—(7) අළුත් වැඩ (තිබ්බොටුවාව කඩ කාමර තැනීම) | 10,000 | 0 |
| ඩී.—(3) (ඊ) වැසිකිළි නඩත්තු කිරීම (තිබ්බොටුවාව වැසිකිලිය අළුත්වැඩියා කිරීම) ... | 200 | 0 |
| එකතුව ... | 11,080 | 0 |

1966.8.27 වැනි දින පැවැත්වූ සභා රැස්වීමේ දී පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයට යටත්ව සභාව විසින් පිළිගනිමින් සම්මත කරගන්නා ලදි.

ඩී. ඒ. සූරියආරච්චි,
සභාපති,
අකුරැස්ස සුළු නගර සභාව.

1966.9.1 දින,
අකුරැස්ස සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරන ලදි.

එච්. ඒ. පී. අභයවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
දකුණු දිසාව (පහළ).

මාතර.
23.10.66,

11-226—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## රත්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ අයදුම්පත

### 1966 අයවැය ලේඛණය—සාමාන්‍ය කොටස

1966 අයවැය ලේඛණයේ ප්‍රතිපාදිත වැය ශීර්ෂයන් යටතේ පහත සඳහන් පරිදි, මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂවලින් මුදල් අවශ්‍ය වැය ශීර්ෂයන්ට මාරුකළ යුතුයයි 1966.10.20 දින පැවති මාසික රැස්වීමේ, යෝජනා අංක 2 (5) යටතේ සම්මතවිය.

| මුදල් ඉතිරිවේයයි ගණන්බලා ඇති වැය ශීර්ෂය | මුදල | | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | මුදල | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| ඒ.—1 (ඊ) කාර්මික උපදේශක ගාස්තු ... ... | 150 | 0 | ඒ.—2 (ඒ) සංස්ථා දීමනා ... ... | 7 | 58 |
| ඒ.—2 (ඩී) තක්සේරු ගාස්තු ... ... | 232 | 28 | 2 (අයි) දුම්රිය බලපත් ගාස්තු ... ... | 200 | 0 |
| | | | 2 (ඩී) මහජන සෞඛ්‍ය— | | |
| | | | 5. (ඒ) ජලසම්පාදන වේතන ... ... | 174 | 70 |
| | | | | 382 | 28 |

ඩබ්ලිව්. එච්. ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, රත්තොට.

1966 ඔක්තෝබර් මස 22 වැනි දින,
රත්තොට සුළු නගර සභා කායර්‍යාලයේදී ය.

11-223—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## අහංගම සුළු නගර සභාව

### අංක 40 (2) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ ඉදිරිපත් කරණ ඉල්ලුම් පත්‍රයයි

### 1966 අයවැය ලේඛනය

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරිවී තිබෙන මුදල් යෙදවීමට වර්ෂ 1966 ක්වූ අගෝස්තු මස 31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී අංක 4 (4) දරණ යෝජනා ස්ථිරත්වය අනුව පහත සඳහන් අන්දමට සභා සම්මත කරගන්නාලදී.

1 වෙනි කොටස—සාමාන්‍ය අංශය

| ශේෂවී ඇති මුදල් | | | අතිරේක ප්‍රතිපාදයන් | | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| නිලධාරීන්ගේ වැටුප්— | | | ඒ.—(2) (බී). ගමන් ගාස්තු ... ... | 400 | 0 |
| ඒ.—(1) (ඒ) ලේකම් ... ... ... | 1,000 | 0 | ඒ.—(2) (ඇෆ්) ලිපිද්‍රව්‍ය මුද්‍රණය, ප්‍රසිද්ධකිරීම හා මුද්දර ... | 600 | 0 |
| | 1,000 | 0 | | 1,000 | 0 |

ඉ. නන්දිපාල,
සභාපති,
අහංගම සුළු නගර සභාව.

1966 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේදී ය.

11-219—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## දෙඩන්දුව උප නගර සභාව

### 1966 පස්වැනි පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | ගණන | |
|---|---|---|
| | රු. | ශ. |
| ඒ.—(2) (ඊ) නීතියේ කටයුතු සඳහා ... ... | 200 | 0 |
| ඒ.—(1) (බී) ලිපිකරු වේතන ... ... | 200 | 0 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 250 | 0 |
| ඒ.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ආදිය ... ... | 200 | 0 |
| ඒ.—(2) (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 150 | 0 |
| | 1,000 | 0 |

### II කොටස විදුලිය

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.—(ඩී) (4) (ඒ) පරිපාලක වේතන ... ... | 900 | 0 |
| ඊ.—(ඩී) (4) (ඩී) නානාප්‍රකාර වියදම් ... ... | 660 | 0 |
| | 1,560 | 0 |

1966 සැප්තැම්බර් මස 20 වැනිද පැවැත්වූ මාසික රැස්වීමේ අංක 4 හා 1966 ඔක්තෝබර් මස 20 වැනිද පැවැත්වූ මාසික රැස්වීමේ අංක 4 සහ 5 යන යෝජනා යටතේ සභා සම්මත විය.

බී. ජේ. ජයවර්ධන'
සභාපති.

දෙඩන්දුව උප නගර සභාව,
1966 ඔක්තෝබර් 23.

11-225—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 3 වන වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර මිනිපේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 5 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර මිනිපේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ඇම්. අප්පුහාමි,
උඩදුම්බර මිනිපේ ගම්සභාපති.

ගම්සභා කාර්යාලය,
හඳගනාව, මිනිපේ, 1966.10.20.

11–232—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කෙහෙල්වත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා වූ වාහන හා සතුන් පිළිබඳ බද්ද

කෙහෙල්වත්ත සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වෙනි පරිච්ඡේදය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උප ලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1967 වර්ෂයට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද, එම ගාස්තු 1966 වර්ෂයේ බලපැවැත්වුනු ගාස්තු වලට සමාන බැව්ද,

(2) එකී ව්‍යවස්ථාවේ අංක 162 (3) වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

ඩර්වින්. එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර,
1966.10.18.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හැර වෙන ඕනෑම වර්ගයේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| (අ) සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක් වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... ... | 5 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි නම් ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2.50 | |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 | 0 |

11–194/1—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කෙහෙල්වත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂයේ සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 477 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තිය ප්‍රකාර, කෙහෙල්වත්ත සුළු නගර සභා සීමාව තුල තබා ගන්නා සෑම බල්ලෙකු හා බැල්ලියක් වෙනුවෙන් රු. 1 ක් ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1967 වර්ෂයට පනවා ඇති බවද, එකී ගාස්තුව 1967 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩර්වින්. එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර,
1966.10.18.

11–794/2—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කෙහෙල්වත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂයට දේපොල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256) වැනි අධිකාරය යටතේ ගනවී යන 1966 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපොළ බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට කෙහෙල්වත්ත සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්ද, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩර්වින්. එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර,
1966.10.18.

11–194/3—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කෙහෙල්වත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂයේ වරිපනම් ලේඛන

1967 වර්ෂය සඳහා සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම් ව ඇති බවත්, එම ලේඛන කාර්යාලීය වේලාවන් තිදී මෙම සුළු නගර සභා කාර්යාලයේදී පරික්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥාපනතේ 135 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩර්වින්. එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

සුළුනගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර,
1966.10.18.

11–194/4—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## කොහොන් සියපත්තුව ගම්සභාව

### ගම්සභා ආඥපනත (257) වැනි පරිච්ඡෙදය

මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන් සියපත්තුව ගම්සභාව විසින් පහත දැක්වෙන යෝජනාව සම්මතකර ගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඩබ්ලිව්. අලවතුවල,
කොහොන් සියපත්තුව ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කායඹාලය, මාතලේ,
1966. 10. 24.

### යෝජනාව

වෂී 1966 ක්වූ අප්‍රේල් මස 21 වැනි දින කොහොන් සියපත්තුව ගම්සභා කායඹාලයේදී පස්වරු 2 ට පවත්වනලද මාසික රැස්වීමේදී සම්මත කරගත් නාලද යෝජනාව අනුව වර්ෂ 1966ක්වූ සැප්තැම්බර් මස 16 වැනි දින ලංකාණ්ඩුවේ අංක 14,713 දරණ ගැසට් පත්‍රයේ පල කිරීමෙන් ප්‍රසිද්ධියට පමුණුවන ලද උපලේඛනයේ (පාරවල් ලැයිස්තුවේ) සඳහන් මංමාවත් හා අඩි පාරවල් සම්බන්ධයෙන් මෙතෙක් කිසිම විරුද්ධතාවයක් ප්‍රකාශකර නැති බැඞින් මෙම යෝජනාව සම්මත කරගත් දිනයේ සිට එම උපලේඛනයේ සඳහන් සියලුම මංමාවත් හා අඩි පාරවල් (මාගී) වලට කොයියම් ක්‍රමයකින් හෝ කුමන අන්දමේ හෝ අන්දමකින් අවහිර හෝ අලාභහානි කිරීම නැතහොත් එසේ අවහිර හෝ අලාභහානි කිරීමට තැත් කරන පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට විරුද්ධව අංක 10,517 හා 1953 අප්‍රේල් මස 10 වැනි දින දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 4, 5 වැනි කාණ්ඩයන්හි ව්‍යවස්ථාවන්ට අනුකූලව හා ගම්සභා ආඥපනතේ 257 වැනි අධිකාරය යටතේ මෙම ගම්සභාව වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරණ බව මහජනතාව වෙතත් කොහොන් සියපත්තුව ගම්සභා ප්‍රදේශවාසීන් වෙත දැනුම් දෙනු ලැබේ.

තවද යථෝක්ත උපලේඛනයේ දැක්වෙන පාරවල් (මාගී) වල මුළු බර ටොන් 1½ කට වැඩි රථවාහන ලොරි, වෑන්, බස්රිය යනාදිය ගෙන යෑම සම්පූර්ණයෙන්ම තහනම් වනවාත් හැර අලි ඇතුන් ලවා ගල් වැලි කඳන් ඇද්දවීමෙන් එකී මංමාවත් (පාරවලට) අලාභහානි කිරීම මතු සඳහන් ව්‍යවස්ථාවන් කඩ කිරීමේ වරදට දඬුවම් ලැබිය යුතු වරදක් හැටියට සැලකිය යුතුයි යනුවෙන් එච්. ඇම්. හීන්බණ්ඩා සහ කේ. ඩී. පුත්‍රසේන යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාසම්මත විය.''

11–242—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පණත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ තුන් වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන මෙහි පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ:—

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දා වූ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවලින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පලවන දින සිට සම්මත කර ගැනීමට නාරම්මල ගම්සභාව විසින් පළාත් පාලන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථාව) පණතේ (261 වෙනි අධිකාරය) තුන් වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජී. ඩී. දයානන්ද,
සභාපති තැන,
නාරම්මල ගම්සභාව.

1966 ඔක්තෝබර් මස 19 වෙනි දින,
ගම්සභා කායඹාලය, සෙම්බුවා වැව, නාරම්මල.

11–195—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය.

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ ව්‍යවස්ථා) පණත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කනෝගම ගම්ප්‍රදේශයේ කනෝගම ගම්සභාව විසින්, සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරණ ලද්දාවූද, උත්තර. මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට කනෝගම ගම්ප්‍රදේශයේ ගම් සභාව විසින්, පලාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවසථා) පනතේ (261 වැනි පරිච්ඡෙදය) 3 වැනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ."

ඇල්. ඇම්. කිරිබණ්ඩා,
කනෝගම ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
කනෝගම, කටුපොත,
1966 ජූනි මස 30 වෙනි දින.

11–228—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1967 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත්කිරීම ගැන, හෙට්ටිපොල ගම්සභා ප්‍රදේශ සීමාවතුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නෙ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට්පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මාවෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඇල්. යූ. අහමදු ලෙබ්බෙ,
හෙට්ටිපොල ගම්සභාවේ සභාපතිතැන.

ගම්සභා කායඹාලය, හෙට්ටිපොල,
1966 ඔක්තෝබර් මස 18 වැනි දින.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| පී. ටී. අබුබක්කර්, මඩිගේම්දියාල, බණ්ඩාරකොස්වත්ත | එළහරක් මස් කඩය | දූරම්දියාල ගමේ ගන් සූරියගහමූල වත්ත |

11–230—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## හපුතලේ නගර සභාව

### ගෝඝාතක ආඥාපණත (272 වැනි අධිකාරය)

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ නම් සඳහන් කොට ඇති අය ඒ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයේ, 1966 වර්ෂයේ නොවැම්බර් මස 1 වෙනි දින සිට 1967 වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා මස්කඩයක් පවත්වාගෙන යෑමට බල පත්‍රයක් ඉල්ලුම්කර ඇති බව ගෝඝාතක ආඥා පණතේ (272 වැනි අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන හපුතලේ නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළතදී මා වෙත ඉදිරිපත් කළයුතු බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ශු. ඇස්. ඉබ්‍රාහිම් සයිබු, දුම්රියපල පාර, හපුතලේ | එළුමස් ... | අංක 2 දරණ එළුමස් කඩය, ප්‍රසිද්ධ වෙළඳ පොල, හපුතලේ. |

ඇම්. එච්. සමයදස,
හපුතලේ නගර සභාපති.

1966.10.26 දින,
හපුතලේ නගර සභා කාර්‍යාලයේදී ය.

11–237—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ මෙගොඩපොත ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් 1967 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන මෙගොඩපොත ගම්ප්‍රදේශ වාසී යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් ඒ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත දී මවෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7 (2) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇස්. ඇම්. ඇන්සාර්, කහටඕවිට, රුක්ගහවිල ... | හරක් මස් ... | ... කහටඕවිට කහටගහවත්ත–අංක 25 දරන කඩය |

ඩී. ආර්. සෙනෙවිරත්න,
සභාපති, මෙගොඩපොත ගම්සභාව.

මෙගොඩපොත ගම් සභා කාර්‍යාලය, ඌරාපොල,
1966.10.24.

11–213—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## වැලිගම පළාත් ආණ්ඩු සභාව

### 1967 සුනඛ බද්ද

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පණතේ 477 වන පරිච්ඡේද යේ 4 වන ඡේදය යටතේ වැලිගම පළාත් ආණ්ඩු සභා සීමාවතුල තබාගන්නා බල්ලකුගෙන් රු. 1 ක්ද, බැල්ලකගෙන් රු. 1.50 ක්ද, අයකරන බවද, එම බද්ද 1967 මාර්තු 31 වන දිනට පෙර ගෙවියයුතු බවද මෙයින් දැනුම් දෙමි.

ම. ප. ලීලාරත්න,
වැලිගම පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

24.10.66 දින,
වැලිගම පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

11–240—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## වැලිගම පළාත් ආණ්ඩු සභාව

### 1967 රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරන වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1967 අවුරුද්දට රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද, එම පනතේ අංක 163 (3) යටතේ එම බදු 1967 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් ... ... | 5 00 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර රථයක් හෝ කරත්තයක්, මෝටර රථයක් හෝ කරත්තයක් ... ... | 2 00 |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 2 00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දැයකට යොදනු ලැබේ නම් ... ... | 1 00 |
| 3. ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කල යක් ... ... | 3 00 |
| 4. තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 2 00 |
| 5. අත් කරත්තයක් ... ... ... | 2 00 |
| 6. ජින් රික්ෂෝ රථයක් ... ... | 2 00 |
| 7. අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් හෝ බූරුවෙක් | 2 00 |

ම. ප. ලීලාරත්න,
වැලිගම පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

1966.10.24,
වැලිගම් පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

11–239—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## මාතර නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1967 වර්ෂය සඳහා දේපල වරිපනම් බද්ද

(255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය යටතේ ගතවී ගිය 1966 වර්ෂයට බලපවත්වන ලද දේපල බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට මාතර නගර සභාව තීරණය කර ඇත.

එම තීරණය ප්‍රකාර, මෙම නගර සභා සීමාව තුල පිහිටි කුඹුරු හැර සෙසු සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට විස්ස බැගින් වූ දේපල වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන පරිදි මාතර නගර සභාව විසින් 1967 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විල්ෆ්‍රඩ් ගුණසේකර,
සභාපති.

1966 ඔක්තෝබර් 26 දින,
මාතර නගර සභා කාර්යාලයය.

11-244—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## මාතර පළාත් ආණ්ඩු සභාව

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු—1967

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි පරිච්ඡේදය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වැනි කොටසේ ප්‍රකාර මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුල තබාගන්නා සෑම බල්ලෙකුට රු. 2.50 ක් හා සෑම බැල්ලකට රු. 5 ක් හා බැගින් 1967 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තු පනවා ඇති බවත්, එකී ගාස්තු 1967 මාර්තු 31 වැනි ද හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

විල්ෆ්‍රඩ් ගුණසේකර,
සභාපති,
මාතර පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලයය,
මාතර, 1966. 10. 24.

11-243/1—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## මාතර පළාත් ආණ්ඩු සභාව

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද-1967

1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 162 (1) (ඒ) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථ වාහන ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගාස්තු (පසුගිය වර්ෂයට මෙන්ම) 1967 වර්ෂයට ද මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පනවා ඇති බවත් එකී ගාස්තු 1967 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, ට්‍රක්කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර වෙන ඕනෑම රථයකට ... ... ... | 2 50 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට | |
| (අ) වෙළෙඳ කායයීයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 5 00 |
| (ආ) වෙළෙඳ කායයීයන් හැර වෙන ඕනෑම කායයීයක් සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් ... | 1 00 |
| ඕනෑම අඳුමක ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... | 3 00 |
| ඕනෑම අඳුමක තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 2 50 |
| ඕනෑම අඳුමක අත්කරත්තයක් වෙනුවෙන් ... | 1 00 |

විල්ෆ්‍රඩ් ගුණසේකර,
සභාපති,
මාතර පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් මස 24 වැනිද,
මාතර පළාත් ආණ්ඩු සභාව.

11-243,2—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

### 1967 වර්ෂයට දේපොළ බද්ද

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරිය යටතේ මෙම ගතවී යන 1966 අවුරුද්දට බලපවත්නා පහත සඳහන් දේපොළ බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට වැලිගම නගර සභාව තීරණය කර ඇති බව, නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

160(3) වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල පිහිටා තිබෙන, කුඹුරු හැර සියලුම නිශ්චල දේපොළවලට වාර්ෂික වටිනාකමින් සියයට දහතුනක් බැගින්ද, කුඹුරුවලට වාර්ෂික වටිනාකමින් සියයට එකොලහක් බැගින්ද වේ. බදු වශයෙන් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින් හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ම. ප. ලීලාරත්න,
සභාපති,
නගර සභාව, වැලිගම.

1966 ඔක්තෝබර් 24 දින,
වැලිගම නගර සභා කාර්යාලයේදීය.

11-238—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### 1967 වර්ෂයට දේපල බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගත වී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1967 වර්ෂයට ද එ ලෙස ම පැනවීමට පුස්සැල්ලාව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයකට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හත බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ඒ. ඩී. ඩබ්ලිව්. පෙරේරා,
පුස්සැල්ලාව සුළු නගර සභාවේ
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
පුස්සැල්ලාව, 1966. 10. 17.

11-193—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## දෙවිනුවර උප නගර සභාව

**සුළු නගර සභා ආඥා පනතේ 57 වන වගන්තියේ තෙවන උප වගන්තිය යටතේ පාරවල් නැවත නම් කිරීම**

සුළු නගර සභා ආඥාපනතේ ඉහත සඳහන් වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල අනුව පහත සඳහන් උපලේඛණයේ ප්‍රකාර දෙවිනුවර සුළු නගර සභා සීමාව තුල පිහිටි පාරවල් නැවත නම් කරණු ලබන බවත් මෙතැන් සිට එම පාරවල් අළුත් නම් අනුව හැඳින්විය යුතු බවත් මින් ප්‍රකාශයට පත් කරමි.

### උප ලේඛනය

| පාර පිහිටි කොට්ඨාශ අංකය | | කලින් තිබූ නම | | නැවත නම් කළ නම |
|---|---|---|---|---|
| II | ... | කිරළවැල්ල පොල්පිටිය පාර | ... | සරණපාල මාවත |
| II | ... | හුණුගොඩ පටු මග | ... | කන්ද මුදුන මාවත |
| V | ... | වට රවුම් පාර | ... | ශ්‍රී සිරිනිවාස මාවත |
| VI | ... | වටරවුම් පාර | ... | රාජකීය පණ්ඩිත පිය රතන මාවත |
| VI | ... | — | ... | විමලජෝති මාවත |
| VI සහ VII | | වෙලේගොඩ පුරාණවැල්ල පාර | | ගුණපාල මාවත |
| VII | ... | වාඩියා පාර | | බණ්ඩරනායක මාවත |

ඩී. ජී. බෙබිසිංඤෝ,
දෙවිනුවර උප නගර සභාවේ සභාපති.

66.10.19 දින,
උප නගර සභා කාර්‍යාලයය,
දෙවිනුවර.

11–234—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ රඹඩගල්ල ගම්සභාව

**ගෝඝාතක ආඥාපනත**

මෙහි උපලේඛනයෙහි සඳහන් අය එකී උපලේඛනයෙහි ඔවුන්ගේ එක් එක් නමට ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1967 වර්ෂයේ මස් පිණිස සතුන් මරා වෙළඳාම කරගන යාම සඳහා බලපත්‍ර මාගෙන් ඉල්ලා ඇති බව, 1947 අංක 44 දරණ ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

යම් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධවීමට අදහස් කරන, කුරුණෑගල දිස්ත්‍රික්කයේ රඹඩගල්ල ගම්සභා ප්‍රදේශයෙහි පදිංචි ඕනෑම කෙනෙකු විසින් බලපත්‍රය නිකුත් කිරීමට තමන්ගේ විරුද්ධත්වයට කරුණු දක්වෙන පිටපත් දෙකකින් යුත් ලිඛිත ප්‍රකාශයක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත සැපයිය යුතුයි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | | වෙළඳාම | | ස්ථානය |
|---|---|---|---|---|---|
| 1. | යූ. සමූන්, හදිරාමුල්ල, පානගමුව ... | ... | එළ හරක් මස් ... | ... | අංක 51, හදිරාමුල්ල |
| 2. | ඇම්. මුහම්මදු නිසාර්, පානගමුව ... | ... | එම | ... | අංක 46, ඇටිකුකුල්පිටිය |
| 3. | ඇම්. සාහුල් හමීඩ්, ඇටිකුකුල්පිටිය, පානගමුව | ... | එම | ... | අංක 49/126, පානගමුව |

ම්. දේ. සමරපාල,
රඹඩගල්ල ගම්සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 17 දින,
රඹඩගල්ල ගම්සභා කාර්‍යාලයේ දී.

11–217—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත**

මෙහි පහත උප ලේඛණයේ නම් සඳහන් අයවළුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1967 වර්ෂයට මස් කඩ පවත්වා ගෙන යැම සඳහා බලපත්‍ර ඉල්ළුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කුරුගල දිස්ත්‍රික්කයේ වැළඩ ගම්සභාවේ පාලන බල සීමාව තුල පදිංචි යම් අයෙකුගේ විරුද්ධත් යක් ඇත්නම්, එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ (201 වෙනි පරිච්ඡෙදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥා පණතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරණ ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | | ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාමේ ස්වභාවය | | ස්ථානය |
|---|---|---|---|---|---|---|
| 1 | ... | ඇම්. අබ්දුල් රසාක්, පරගහදෙණිය, වැළඩ ... | ... | හරක් මස් | ... | පරගහදෙණිය තල්ගහමුල වත්ත |
| 2 | ... | එච්. අබ්දුල් කාෆූර්, කදුරු අංග, වැළඩ ... | ... | එම | ... | කදුරුඅංග රාලගේ වෙලේ පිටිය |
| 3 | ... | කේ. ඔමරු ජවුපර්, තල්ගස්පිටිය, අඹකොටේ | ... | එම | ... | තල්ගස්පිටිය වාගහ මුල වත්ත |
| 4 | ... | ඇම්. ඔමරු ජවුපර්, තල්ගස්පිටිය, අඹකොටේ | ... | එම | ... | තල්ගස්පිටිය, වාගහමුල් වත්ත, |

ඇම්. ඇල්. ඒ. අසීස්,
වැළඩ ගම්සභාවේ සභාපති.

1966.10.22 දින,
වැළඩ ගම්සභා කාර්‍යාලයේදීය.

11–202—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## පස්සර සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අයවිසින් ඔහුගේ නමට ඉදිරියෙන් දක්වෙන ස්ථානයේ 1967 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥ පනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරනලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන පස්සර සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද, යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවියයුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. එච්. ඇම්. මුබාරක් ... | පස්සර සුළු නගර සභා අංක 1 දරණ කඩකාමරය ... ... | හරක් මස් |
| 2. ඇම්. එච්. ඇම්. මුබාරක් ... | පස්සර සුළු නගර සභා අංක 2 දරණ කඩකාමරය ... ... | හරක් මස් |
| 3. ඇම්. එච්. ඇම්. මුබාරක් ... | පස්සර සුළු නගර සභා අංක 4 දරණ කඩකාමරය ... ... | එළු මස් |

ඇ. පී. ඇඩ්මන්,
සභාපති,
සුළු නගර සභාව, පස්සර.

1966 ක් වූ ඔක්තෝබර් මස 22 වන දින,
පස්සර සුළු නගර සභා කාර්යාලයේදීය.

11–200—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## උඩුව පළාත ගම්සභාව—කෑගල්ල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1967 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බල පත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩුව පළාත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැළැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇල්. සෙයිනදීන්, බුලත්කොහුපිටිය ... | එළුහරක් මස් ... ... | බුලත්කොහුපිටියේ ගිනිවලපිටිය අංක 41 දරණ ස්ථානය |

ජේ. ප්‍රේමදාස,
සභාපති,
උඩුව පළාත ගම්සභාව.

1966 ඔක්තෝබර් මස 20 දින,
බුලත්කොහුපිටිය, ගම්සභා කාර්යාලයේදීය.

11—208ඒ—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## ආණමඩුව ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් 1966 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩයක් පවත්වාගෙන යෑමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බැවින් ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීම ගැන ආණමඩුව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම්කෙනෙක් විරුධ වන්නේ නම් එසේ විරුධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින දහහතරක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ අංක 7 දරන හා 1947 තේ අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ විස්තර | මරන ස්ථානය | කඩය පවත්වන්ට අදහස්කරන ස්ථානය |
|---|---|---|---|
| ෂෙක්තාහර්, ආණමඩුව... | හරක්මස් හා එලුමස් ... | පලුගහවත්ත, ආණමඩුව ... | පලුගහවත්ත ආණමඩුව |

ඇම්. කරුණාරත්න,
ආණමඩුව ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
ආණමඩුව, 1966.10.22.

11–199—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

## හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වැනි වගන්ති යටතේ හික්කඩුව සුළු නගර සභාව විසින්, මෙම නිවේදනයට යාකොට ඇති උප ලේඛනයෙහි විස්තර කෙරෙන බලපත්‍ර සම්බන්ධයෙන්, එකී බලපත්‍ර සඳහා මේ දක්වා අයකල හැකිව තිබූ බලපත්‍ර ගාස්තු වෙනුවට මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කෙරෙන දිනයෙහි සිට වලංගුවන පරිදි එම උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ටී. පියදාස,
සභාපති, හික්කඩුව සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 23 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

පහත සඳහන් කාර්යයන් සඳහා යම් භූමි භාගයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය පවරන බලපත්‍රය :—

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ... ... | 250 | 0 |
| සිල්ලරට විකිණීම සඳහා නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ... ... | 20 | 0 |
| පින්තූර හෝ ඡායාරූප රාමු කිරීම ... ... | 25 | 0 |
| ලීබඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම හෝ ලීබඩු සෑදීම | 30 | 0 |
| මිණී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම ... ... | 30 | 0 |
| ලිහිස්සි තෙල් (ඇන්ජින් තෙල්) ගබඩා කිරීම ... | 30 | 0 |
| පැට්‍රල් ගබඩා කරන ස්ථානයක් (ඩිපෝවක්) පවත්වාගෙන යෑම ... ... | 200 | 0 |
| භූමිතෙල් ගබඩා කරන ස්ථානයක් (ඩිපෝවක්) පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| ඩීසල් තෙල් ගබඩා කරණ ස්ථානයක් (ඩිපෝවක්) පවත්ගෙන යෑම ... ... | 50 | |
| භෝජනාගාරයක් පවත්වාගෙන යෑම :— | | |
| (අ) වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩිවූ විට ... | 250 | 0 |
| (ආ) වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩි නොවූවිට ... | 30 | 0 |
| ආපන ශාලාවක් පවත්වාගෙන යෑම :— | | |
| (අ) වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩිවූ විට ... | 250 | 0 |
| (ආ) වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩි නොවූවිට | 30 | 0 |

11–198—66.11.3 දින අංක 14,720 දරණ ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත උතුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

පළාත් පලාන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත උතුර ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ඇම්. ජයසුන්දර,
උඩුනුවර මැද පළාත උතුරු ගම්සභාවේ
සභාපති තැන.

1966 ඔක්තෝබර් මස 10 වැනි දින,
හියාරාපිටිය-හන්දෙස්ස,
ගම්සභා කාර්යාලයේ දීය.

11–241/1—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත උතුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත උතුර ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ඇම්. ජයසුන්දර,
උඩුනුවර මැද පළාත උතුරු ගම්සභාවේ
සභාපති තැන.

1966 ඔක්තෝබර් මස 10 වැනි දින,
හියාරාපිටිය-හන්දෙස්ස,
ගම්සභා කාර්යාලයේ දීය.

11–241/2—66.11.3 දින අංක 14,720 දරන ගැසට් පත්‍රය

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**(සැම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)**

**1.** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

**2.** පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

**3.** පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

**4.** පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන්වේ.

**5.** සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

**6.** ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත '' පිටපත '' කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7.** සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

**8.** වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

**9.** උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

**10.** 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 15 | 0 |
| වැඩිවන සැම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 330 | 0 |

අඟලේ සැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

**11.** සැම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ '' ගැසට් '' පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12.** 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙලවරෙහි වෙනම පලවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

**13.** 66.7.1 දින සිට සංශොධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොටසක් | ... | ... | ... | 36 | 0 | ... | 49 | 0 |
| I වැනි කොටසේ එක ජෙදයක් | | ... | ... | 26 | 0 | ... | 31 | 50 |
| I වැනි කොටසේ ජෙද දෙකක් | | ... | ... | 33 | 50 | ... | 41 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට හො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 | 40 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු එක කොටසක්... | 0 | 80 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ජෙදයක් ... ... | 0 | 20 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ජෙදයක් ... ... | 0 | 40 | ... | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.**

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා **අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති** උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන **වේලාවක් දී** තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ **පහසුවටද හේතුවන බව සලකන්න.**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම** **යැවිය යුතුය.**

**උපලේඛනය**

**1966**

| මාසය | **පළකිරීමේ දිනය** | | | **ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව** | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | .. | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව 3.30 |

1966 ජූලි 15 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති**